ජුමුආ දිනයේ ඉමාම් දේශනාව කරමින් සිටිය දී දණිස් සිටුවා පාද උදරයට තුරුල් කර ගනිමින් පසුපස පැත්තෙන් වාඩිවීමෙන් නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වැළැක්වූහ.

මුආද් ඉබ්නු අනස් අල් ජුහනී -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. ජුමුආ දිනයේ ඉමාම් දේශනාව කරමින් සිටිය දී දණිස් සිටුවා පාද උදරයට තුරුල් කර ගනිමින්
පසුපස පැත්තෙන් වාඩිවීමෙන් නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වැළැක්වූහ.
[හසන් ගණයට අයත් හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - ඉමාම් අබූ දාවූද් එය වාර්තා කර ඇත - අහ්මද්
එය වාර්තා කර ඇත]

මෙය මන්සූහ්ඃ හෙවත් වෙනස් කරන ලද හදීසයකි. පෙර හදීසයෙන් පසුව අබූ දාවුද් තුමා එය සංකේතවත් කර ඇත. ජුමුආ දිනයේ ඉමාම් දේශනාව කරමින් සිටිය දී දණිස් සිටුවා පාද උදරයට තුරුල් කර ගනිමින් පසුපස පැත්තෙන් වාඩිවීමෙන් නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වැළැක් වූ බව මුආද් ඉබ්නු අනස් -රළියල්ලාහු අන්හු- තුමා විසින් දන්වා ඇත. හිබ්වත් යනු, මිනිසා තම කලවා තම උදරය සමඟ ළංකොට තම කෙණ්ඩය කලවා සමග ළං කොට තම අතින් හෝ පටියකින් හෝ එවන් යම් දෙයකින් බැඳගෙන වාඩිවීමය.ජුමුආ දිනයේ ඉමාම් කුඃත්බා දේශනාව කරමින් සිටියදී එසේ වාඩි වීමෙන් කරුණු දෙකක් මත නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වැළැක්වූහ. පළමුවැන්න, එසේ වාඩි වීම නිදිමත ගතිය ඈඳෙන්නට හේතුවක් වෙයි. එමගින් දේශනාවට සවන් නොදී නින්දට වැටෙනු ඇත. දෙවැන්න, රහස්ය පෙදෙස් නිරාවරණය වීමට අවස්ථාව එළැඹෙනු ඇත. බහුතරයක් (පැරණි) අරාබිවරු අඳිනුයේ එක වස්ත්රයකි. එසේ වාඩිවීමෙන් තම රහස්ය පෙදෙස් නිරාවරණය වනු ඇත. එහෙයින් මෙහි මෙම තහනම පොදුවේ සඳහන්ව ඇත. සහීහ් මුස්ලිම් හි තම ලිංගය නිරාවරණය වන අයුරින් එක රෙද්දකින් පැළඳ මෙසේ වාඩිවීම තහනම් බව සඳහන් වේ. ඉමාම් නවවි -රහිමහුල්ලා-තුමා මෙසේ දන්වා සිටියි. අරාබිවරු ඔවුන්ගේ සභාවන්හි මෙසේ ඉහ්තිබා ක්රමයට වාඩි වීම සිරිතක් විය. ඔහුගේ රහස්ය පෙදෙසින් යමක් නිරාවරණය වී නම් එය හරාම් හෙවත් තහනම්ය. නමුත් එයින් සුරක්ෂිත නම් එසේ වාඩිවීමෙහි වරදක් නැත. හේතුව තහනමට යම් බුද්ධිමය හේතුවක් ඇත්නම් එම හේතුව ඉවත්වීමත් සමග තහනමද ඉවත් වනු ඇත. නබි-සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමාණන් පිළිබඳ අබ්බාද් ඉබ්නු තමීම් -රළියල්ලාහු අන්හු- තුමා වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. මස්ජිදයේ කකුලක් මත කකුලක් තබා උඩුබැලි අතට හාන්සි වී සිටින්නෙකු නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමා දුටහ. මුස්ලිම්හි විග්රහය: ඉමාම් නවවි (14/77) රියාලුස් සාලිහීන්හි විග්රහය: (6/449)

http://www.sunnah.global/hadeeth/si/show/8955